SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය . 12 ශ්‍රේණිය . 2026
Third Term Test - Grade 12 - 2026

01 S I

භෞතික විද්‍යාව I

පැය දෙකයි
Two Hours

නම / විභාග අංකය : .....

උපදෙස් :


- **මෙම ප්‍රශ්න පත්‍රය පිටු 9 කින් සමන්විත වන අතර ප්‍රශ්න 50 ක් අන්තර්ගත වේ.**
- **01 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නය පහත දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු හෝ පිළිතුර තෝරාගෙන එය පිළිතුරු පත්‍රයේ කතිරයකින් (×) ලකුණු කරන්න.**
- **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු නොලැබේ.**
- **(ගුරුත්ව ත්වරණය $g = 10\ ms^{-2}$)**

---

(01) $K_1 \log (K_2 l \times \frac{1}{V}) = K_3$ සමීකරණයේ V හා I පිළිවෙලින් වෝල්ටීයතාවය හා ධාරාව වේ. K_1 මාන රහිත නියතයකි. K_3 සඳහා,


(1) ප්‍රතිරෝධයේ මාන ඇත.
(2) ධාරාවේ මාන ඇත.
(3) වෝල්ටීයතාවයේ මාන ඇත.
(4) ප්‍රතිරෝධයේ පරස්පරයේ මාන ඇත.
(5) මාන නොමැත.

(02) වෘත්කාර පරිමාණය කොටස් 50 කින් යුක්ත වන ඉස්කුරුප්පු ආමානයක මූලාංක දෝෂය 1 රූපයේ දැක්වේ. කම්බියක විෂ්කම්භය මැනීම සඳහා එය භාවිතා කළ විට පරිමාණ II රූපයේ පරිදි පිහිටයි. කම්බියේ විෂ්කම්භය වනුයේ,



(1) 2.25 mm (2) 2.47 mm (3) 2.61 mm (4) 2.75 mm (5) 2.97 mm

(03) වස්තුවක් මත ක්‍රියාකරන F_1, F_2, F_3 බල පද්ධතියක විශාලත්වය හා දිශාව පහත ප්‍රස්ථාරයේ දැක්වෙන පරිදි වේ. මෙම පද්ධතියේ සම්ප්‍රයුක්තයට විශාලත්වයෙන් සමාන හා දිශාවෙන් ප්‍රතිවිරුද්ධ වන සම්ප්‍රයුක්ත බලයක් වස්තුව මත ක්‍රියා කිරීම සඳහා එය මත යෙදිය යුතු අමතර බල වනුයේ,



(1) +X දිශාවට 2 N බලයක් හා Y දිශාවට 4 N බලයක්.
(2) -X දිශාවට 4 N බලයක් හා +Y දිශාවට 2 N බලයක්.
(3) -X දිශාවට 2 N බලයක් හා -Y දිශාවට 4 N බලයක්.
(4) -X දිශාවට 4 N බලයක් හා +Y දිශාවට 4 N බලයක්.
(5) +X දිශාවට 8 N බලයක් හා -Y දිශාවට 4 N බලයක්.

(04) රථයක ටයරයක් තුළ ඇති වාතයේ පීඩනය 10 KPa ලෙස පීඩන මානයක් මඟින් දක්වයි නම් එය Nm^{-2} වලින්,

(1) 10^3 (2) 10 (3) 10^{-3} (4) 10^4 (5) 10^{-2}


SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(05) ඉහළ සිට සීරුවෙන් බිම හෙලන වස්තුවක දෙවන තත්පරය අවසානයේ එහි චාලක ශක්තිය E නම් තත්පර පහක් අවසානයේ එහි චාලක ශක්තිය වන්නේ,

(1) $5E$ (2) $2E$ (3) $\frac{25\,E}{4}$ (4) $\frac{2\sqrt{5}\,E}{16}$ (5) $2\sqrt{5}E$

(06) රූපයේ දැක්වෙන පරිදි PQ නම් සුමට ආනත තලයක් දිගේ නිදහසේ චලිත වන වස්තුවක් Q හිදී ආනත තලයෙන් ඉවත් වී වාතය තුළින් ගමන් කර R හිදී තිරස් බිමක් හා ගැටේ. මෙම මුළු චලිතය සඳහා වස්තුවේ ත්වරණය a, කාලය t සමඟ වෙනස් වන අයුරු පහත දැක්වෙන කවර ප්‍රස්ථාරයකින් වඩාත් හොඳින් නිරූපණය වේද?



(07) වස්තුවක සමතුලිතතාව පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.

A - වස්තුව මත ක්‍රියා කරන බලවල සම්ප්‍රයුක්තය ශූන්‍ය විට වස්තුව සමතුලිතව පවතී.

B - ලක්ෂ්‍යයක් වටා වස්තුවක් මත ක්‍රියා කරන බලවල සූර්ණ වල වීජීය එකතුව ශූන්‍යය විට වස්තුව සමතුලිත විය යුතුය.

C - සමතුලිත වස්තුවක එහි ගුරුත්ව කේන්ද්‍රය හරහා සම්ප්‍රයුක්ත බලයන් පැවතිය හැක.

(1) A පමණක් සත්‍ය වේ. (2) B හා C පමණක් සත්‍ය වේ.

(3) C පමණක් සත්‍ය වේ. (4) A, B හා C සියල්ලම සත්‍ය වේ.

(5) A, B හා C සියල්ලම අසත්‍ය වේ.

(08) ඝර්ෂණ ඇති තිරස් රළු පොළවක වස්තුවක් තබා V ප්‍රවේගයක් ලබා දුන් විට a දුරක් ගමන් කර නිශ්චල වේ නම් පහත සම්බන්ධතා වලින් නිවැරදි වනුයේ, (පොළව හා වස්තුව අතර ස්ථිතික ඝර්ෂණ සංගුණකය μ_1 වන අතර ගතික ඝර්ෂණ සංගුණකය μ_2 වේ.)

(1) $u=\sqrt{\mu_1 ag}$ (2) $u=\sqrt{\mu_2 ag}$ (3) $u=\sqrt{2\mu_1 ag}$ (4) $u=\sqrt{2\mu_2 ag}$ (5) $u=\sqrt{(\mu_1+\mu_2)ag}$

(09) ස්කන්ධය m වූ වැහි බිංදුවක් වාතය තුළින් v නියත ප්‍රවේගයෙන් බිමට වැටේ. වාතය මගින් වැහි බිංදුවට ඇති වන ප්‍රතිරෝධී බලය kv^2 වේ. මෙහි k යනු නියතයකි. ගුරුත්වජ ත්වරණය g නම් වැහි බිංදුවේ චාලක ශක්තිය වන්නේ,

(1) $\frac{m^2g}{2k}$ (2) $\frac{m^2g}{k}$ (3) $\frac{m^2g^2}{k}$ (4) $\frac{m^2g}{2k^2}$ (5) $\frac{m^2g}{k^2}$

(10) රූප සටහනේ පරිදි 30 kg ස්කන්ධ ඇති ළමයෙකු සහ 70 kg ස්කන්ධය ඇති මිනිසකු අයිස් තට්ටුවක් මත සිට ගෙන දෙඅත් තද කර එකිනෙක තල්ලු කරගනී. මිනිසා $0.3\ ms^{-1}$ වේගයෙන් අයිස් මත ඉවතට විසි වී යයි. ඔවුන් දෙදෙනා අතර පරතරය 3 m වනුයේ කොපමණ කාලයකට පසුවද?


(1) 10 s

(2) 0.1 s

(3) 5 s

(4) 0.5 s


(5) 3 s



SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK


(11) දක්ෂිණාවර්තව භ්‍රමණය කර විසි කරන ලද බෝලයක් සටහනේ පෙන්වන දිශාවට ගලා යන ජල පහරකට හසු වූ විට බෝලයේ ගමන් දිශාව වනුයේ,



(1)  (2)  (3) 

(4)  (5) 


(12) පියන විවෘත සිලින්ඩරාකාර ටැංකියක උසකට ජලය පිරී ඇත. ටැංකියේ මතුපිට ජල පෘෂ්ඨයේ වර්ග ඵලය මෙන් තුනෙන් පංගුවක වර්ග ඵලයක් ඇති සිදුරක් ටැංකිය පතුලේ ඇති වූයේ නම් එම සිදුරෙන් පිට වන ජලය විදින වේගය වනුයේ,



(1) $\sqrt{2gh}$ (2) $\sqrt{gh}$ (3) $\frac{\sqrt{gh}}{2}$

(4) $\frac{3\sqrt{gh}}{2}$ (5) $\frac{\sqrt{1}}{2gh}$

(13) රළු මේසයක් මත තබා ඇති ස්කන්ධය M වූ පෙට්ටියක් මත P තිරස් බලයක් ලබා දී සමතුලිතතාවයේ පවත්වා ගෙන ඇති අවස්ථාවක් රූපයේ දැක්වේ. මෙහි F යනු ඝර්ෂණ බලයයි.



මෙහි G යනු ගුරුත්ව කේන්ද්‍රය වේ. පහත ප්‍රකාශ වලින් **අසත්‍යය** වනුයේ,

(1) මෙහි M g යනු වස්තුව විසින් මේසය මත ක්‍රියා කරන බලයයි.


(2) මෙහි P හි විශාලත්වය F හි විශාලත්වයට සමාන වේ.

(3) මෙහි R යනු පොළව මගින් ඇති කරන අභිලම්බ ප්‍රතික්‍රියාව වන අතර එය නිවැරදිව ලකුණු කර නොමැත.

(4) මෙහි වස්තු මත පොළවෙන් ක්‍රියා කරන බලය F හා R හි සම්ප්‍රයුක්තය වේ.

(5) මෙහි $R = M g$ වේ.

(14) ඉහත පද්ධතිය ආනත තලය සුමට වන අතර පද්ධතිය නිශ්චලව තබා සීරුවෙන් මුදා හරී නම් දුනු තරාදියේ පෙන්වන පාඨාංකය වනුයේ,



(1) 2.4 kg


(2) 3.0 kg

(3) 3.6 kg

(4) 4 k

(5) 6.0 kg

(15) සුමට පෘෂ්ඨයක් මත තැබූ A, B, C හා D වස්තු හතරකට F බලයක් ලබා දුන් විට පද්ධතියේ ත්වරණය a නම් A මගින් B මත ක්‍රියා කරන ප්‍රතික්‍රියාව R නිරූපණ **නොවන්නේ**,




(1) $(m_2 + m_3 + m_4)a$ (2) $(F - m_1 a)$ (3) $\frac{F(1 - m_4)a}{(m_1 + m_2 + m_3 + m_4)}$

(4) $\frac{F(1 - m_4)a}{(m_1 + m_2 + m_3 + m_4)}$ (5) $\frac{F - Fm_1}{(m_1 + m_2 + m_3 + m_4)}$


SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(16) වස්තුවක් සිරස්ව ඉහළට ප්‍රක්ෂේපණය කරයි. එය සිරස්ව H උසක් නැගුණ පසු ආපසු පළමු ලක්ෂ්‍යයටම පැමිණේ. වාත ප්‍රතිරෝධය නොසලකා හැරිය විට ගලෙහි චාලක ශක්තිය E නම් වස්තුව ගමන් කළ දුර (x) සමඟ චාලක ශක්තිය (E) වෙනස් වන ප්‍රස්ථාරය වනුයේ,



(17) කප්පිය සහිත ලෑල්ලේ ස්කන්ධය 20 kg පද්ධතියක් මත 40 kg වූ ළමයෙකු සමතුලිතතාවයේ සිටී නම් ළමයා තන්තුව මත ඇති කරන බලය වනුයේ,



(1) 150 N

(2) 200 N

(3) 300 N

(4) 400 N

(5) 600 N


(18) දියවන අයිස් තුලදී සහ නටන ජලය තුලදී වීදුරු . රසදිය උෂ්ණත්වමානයක රසදිය කඳේ දිග ප්‍රමාණ පිළිවෙළින් 4 cm හා 12 cm වේ. 10^0C උෂ්ණත්වයේ පවත්වා ගෙන ඇති ශීත කාමරයක් තුළ මෙම උෂ්ණත්වමානය තබා ඇති විට එහි රසදිය කඳේ දිග, (cm)

(1) 0.8 (2) 2.4 (3) 3.2 (4) 4.8 (5) 5.4

(19) පරිමාව V වන සංවෘත භාජනයක T නියත උෂ්ණත්වයේ වායු මිශ්‍රණයක් අඩංගු වේ. එහි O_2 වායුව 8 g ද N_2 වායුව 14 g හා CO_2 වායුව 22 g ක් අඩංගු වේ. වායු මිශ්‍රණයේ මුළු පීඩනය වනුයේ,

(1) $\frac{RT}{V}$ (2) $\frac{3RT}{2V}$ (3) $\frac{5RT}{4V}$ (4) $\frac{7RT}{5V}$ (5) $\frac{RT}{3V}$

(20) රූපයේ දැක්වෙන පරිදි අරය 4R වන ස්කන්ධය M වන වෘත්තාකාර තහඩුවකින් අරය R වන තහඩු කොටසක් කපා ඉවත් කර ඇත. O ලක්ෂයෙන් තහඩුව රඳවා සමතුලිතව තබා ඇත්තේ m ස්කන්ධයක් රූපයේ පරිදි එල්වීමෙනි. මෙයට M/m අනුපාතය වනුයේ,



(1) 4:1

(2) 8:3

(3) 16:1


(4) 32:3


(5) 64:3

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(21) 0^0C ජලය අඩංගු බීකරයක ඒකාකාර ඝන සිලින්ඩරයක් අක්ෂය සිරස්ව පාවේ. එම පද්ධතිය නියත සීඝ්‍රතාවයකින් රත් කරන විට ජල පෘෂ්ඨයට ඉහළින් පිහිටි සිලින්ඩරයේ උස h නම් කාලය t සමඟ විචලනය නිවැරදිව දක්වන ප්‍රස්ථාරය වනුයේ,






(22) තිරස් තලයක් මත අචල ලක්ෂයකට සවි කළ දිග ප්‍රත්‍යස්ථ තන්තුවක අනෙක් කෙළවරට කුඩා සෙල්ලම් කාර් එකක් සවි කර ඇති අතර කාරය කේන්ද්‍ර කරගෙන හරහා තිරස් තලයක් වෘත්තාකාර චලිතයක යෙදේ. එය 1.5 m ක වෘත්තයක යන විට එහි ආවර්ත කාලය තත්පර $2\sqrt{2}$ නම් එය අරය 3 m වන වෘත්තයක ගමන් කරන විට ආවර්ත කාලය වන්නේ තත්පර,

(1) 1 (2) 3 (3) 2 (4) 4 (5) 6

(23) ඒකාකාර හරස්කඩක් සහිත සිලින්ඩරාකාර ලී කොටක් රූපයේ පරිදි h_0 උසක් ජලයේ ගිලී පාවේ. කුරුල්ලකු ලී කොටය මත වසන අතර පසුව කුරුල්ලා ඉගිල ගිය විට ලී කොටය සිරස් අක්ෂය ඔස්සේ සරල අනුවර්තී චලිතයක යෙදේ. එම චලිතය සම්බන්ධයෙන් පහත වගන්ති සලකන්න.



(a) එහි ආවර්ත කාලය $T = 2\pi\sqrt{\frac{h_0}{g}}$ මඟින් ලබා දේ.

(b) චලිතයේ විස්තාරය කුරුල්ලාගේ ස්කන්ධය, ලී කොටසේ හරස්කඩ වර්ගඵලය හා ජලයේ ඝනත්වය මත රඳා පවතී.

(c) චලිතයේ විස්තාරය ලී කොටය ආරම්භයේදී ගිලී ඇති උස h_0 මත රඳා පවතී.

මින් සත්‍ය වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) A හා C පමණි. (5) A, B, C සියල්ලම.

(24) සරල අනුවර්තීය චලිතයක ආවර්ත කාලය 0.01 s කදී විස්තාරය 0.2 m ද වේ. එම චලිතයේ යෙදෙන අංශුවේ උපරිම වේගය ms^{-1} වලින්,

(1) 20π (2) 100π (3) 40π (4) 100π (5) 20π

(25) අන්වීක්ෂයක් හා දුරේක්ෂයක් යන දෙකටම උත්තල කාච දෙක බැගින් ඇති අතර එම උපකරණ දෙකම සාමාන්‍ය සීරු මාරු අවස්ථාවේ භාවිතා කරන විට පහත කවර ප්‍රකාශ දෙකටම සත්‍ය වේද?

(1) දෙකෙහි ම අවනෙත් කාච වලට වැඩි නාභි දුරක් පවතී.

(2) දෙකෙහි ම කාච දෙක අතර දුර ඒවායේ නාභි දුර වල එකතුවට සමාන වේ.

(3) දෙකෙහි ම අවසාන ප්‍රතිබිම්භය යටිකුරු හා අතාත්වික වේ.

(4) දෙකෙහි ම අවනෙත් කාචය මඟින් සාදන ප්‍රතිබිම්භය යටිකුරු හා විශාලනය වී ඇත.

(5) දෙකෙහි ම අවසන් ප්‍රතිබිම්භය විෂද දෘෂ්ටියේ අවම දුරින් සෑදේ.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(26) එකම ස්කන්ධයන් හා අරයන් සහිත ඝන සහ කුහර සිලින්ඩර දෙකක් රළු ආනත තලයක මුදුනේ එකම උසක සිට නිශ්චලතාවයෙන් අත්හළ විට ඒවා ලිස්සීමකින් තොරව පෙරලේ නම් මන් නිවැරදි වන්නේ,

(1) සිලින්ඩර දෙකම එකම මොහොතේ පතුලට ළඟාවේ.

(2) සිලින්ඩර දෙකම පතුලට ළඟාවන ප්‍රවේග එකම වේ.

(3) කුහර සිලින්ඩරය පළමුවෙන් පතුලට ළඟාවේ.

(4) ඝන සිලින්ඩරය පළමුවෙන් පතුලට ළඟාවේ.

(5) පතුලට ළඟාවන විට කුහර සිලින්ඩරයට වැඩි වේගයක් පවතී.

(27) ඝනත්වයෙන් වෙනස් ද්‍රව දෙකක් සමාන පරිමා මිශ්‍ර කළ විට සාපේක්ෂ ඝනත්වය 4 ක් වන ද්‍රවයක් ලැබේ. ද්‍රව දෙකෙහි සාපේක්ෂ ඝනත්වය විය හැක්කේ,

(1) 7 සහ 3 (2) 3 සහ 4 (3) 5 සහ 2 (4) 6 සහ 2 (5) 8 සහ 1


(28) රෙදි සෝදන යන්ත්‍රයක මෝටරයකින් කරකවන භ්‍රමණ තැටියට භ්‍රමණ අක්ෂය $5\ kgm^2$ වටා අවස්ථිති සූර්ණයක් ඇත. නිශ්චලව ඇති භ්‍රමණ තැටියට 240 rpm භ්‍රමණ සීඝ්‍රතාවක් ලබාදීමට මෝටරයට 5 s ක කාලයක් ගත වේ නම් එම මෝටරයට තිබිය යුතු අවම ප්‍රතිදාන ක්ෂමතාව වන්නේ, ($a^2 = 10$ ලෙස ගන්න.)

(1) 200 W (2) 300 W (3) 320 W (4) 350 W (5) 400 W

(29) රූපයේ දැක්වෙන්නේ හරස්කඩ වර්ගඵලය $2\ cm^2$ හා $8\ cm^2$ වූ පිළිවෙලින් X හා Y නම් සුමට පිස්ටන දෙකක් මඟින් සිරකර ඇති අසම්පීඩ්‍ය ද්‍රවයක් අඩංගු ද්‍රාව පීඩක පද්ධතියකි. X පිස්ටනය මත 10 N ක බලයක් යෙදූ විට Y පිස්ටනය මත යෙදෙන F_2 හි විශාලත්වය වන්නේ,

(1) 50 N (2) 40 N (3) 30 N

(4) 20 N (5) 10 N



(30) ස්කන්ධය M හා අරය R වෘත්තාකාර තැටියකට කේන්ද්‍රය හරහා යන සිරස් අක්ෂය වටා ඝර්ෂණ ව්‍යාවර්තයකින් තොරව භ්‍රමණය විය හැක. එය $6\ rads^{-1}$ කෝණික ප්‍රවේගයකින් භ්‍රමණය වෙමින් තිබියදී එක එකෙහි ස්කන්ධය $\frac{M}{2}$ බැගින් වූ කුඩා ලෝහ කුට්ටි දෙකක් තැටියේ විෂ්කම්භයක දෙකෙලවර පරිධියට ආසන්නව පවතින තැටිය මත ලක්ෂ්‍ය දෙකක සිරුවෙන් තැබූ විට පද්ධතියේ නව කෝණික ප්‍රවේගය වන්නේ, $rads^{-1}$

(1) 2 (2) 3 (3) 4 (4) 5 (5) 6

(31) තිරස්ව පියාසර කරන ගුවන් යානයකට සාපේක්ෂව තටුවට යාන්තමින් පහළ වාතයේ ප්‍රවේගය $200\ ms^{-1}$ ද තටුවට යන්තම් ඉහළ වාතයේ ප්‍රවේගය $250\ ms^{-1}$ ද වේ. යානයේ තටු එක එකෙහි යටි පැත්තේ වර්ගඵල $50\ m^2$ බැගින් වේ. වාතයේ ඝනත්වය $1.2\ kgm^{-3}$ නම් යානයේ ස්කන්ධය වන්නේ,

(1) 12×10^4 kg (2) 13.5×10^3 kg (3) 15×10^4 kg (4) 10×10^4 kg (5) 13.5×10^4 kg


(32) ඒකාකාර ඝන ගෝලයක් එකිනෙක හා මිශ්‍ර නොවන ද්‍රව දෙකක අන්තර් මුහුණතේ ඉපිලෙමින් පවතී. ඉහළින් පවතින ද්‍රවයේ ඝනත්වය P_1 ද, පහළ ද්‍රවයේ ඝනත්වය P_2 ද, ගෝලය සෑදී ද්‍රව්‍යයේ ඝනත්වය P ද වේ. ගෝලයේ පරිමාවෙන් ඉහළ ද්‍රව්‍ය තුළ පවතින භාගික පරිමාව වන්නේ,

(1) $\frac{P_2}{P_1}$ (2) $\frac{P - P_1}{P_2 - P_1}$ (3) $\frac{P_2 - P}{P_2 - P_1}$ (4) $\frac{P_1}{P_2}$ (5) $\frac{P_2}{P_2 - P_1} - P$

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(33) වස්තුවක අවස්ථිති සූර්ණය සම්බන්ධව කර ඇති ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.



(a) වස්තුවක අවස්ථිති සූර්ණය අදිශ රාශියක් වේ.

(b) වස්තුවක භ්‍රමණ අවස්ථිතිය සහ අවස්ථිති සූර්ණය වෙනස් රාශීන් දෙකක් වේ.

(c) භ්‍රමණය වන වස්තුවක ස්කන්ධ ව්‍යාප්තිය විශාල වන විට අවස්ථිති සූර්ණයද වැඩි වේ.

ඉහත ප්‍රකාශ වලින්,

(1) A පමණක් සත්‍ය වේ. (2) B පමණක් සත්‍ය වේ. (3) C පමණක් සත්‍ය වේ.

(4) A හා C පමණක් සත්‍ය වේ. (5) B හා C පමණක් සත්‍ය වේ.

(34) දුර දෘෂ්ටිකත්වයෙන් පෙළෙන ඇසක අවිදුර ලක්ෂ්‍යයට ඇසේ සිට දුර 51 cm කි. ඇසට 26 cm ක් දුරින් පිහිටි වස්තුවක් දැක ගැනීම සඳහා පළඳින උපැස් කාචය අක්ෂි කාචයට 1 cm ක් ඉදිරියෙන් පවතී. පැළඳි උපැස් කාච වර්ගය සහ එහි බලය වන්නේ,

(1) උත්තල +2D (2) අවතල -2D (3) උත්තල +50/27D

(4) අවතල -50/27D (5) උත්තල +27/13D


(35) නාභි දුර 16 cm වූ උත්තල කාචයක් මගින් වස්තුවක් මෙන් දෙගුණයක් විශාල තාත්වික ප්‍රතිබිම්බයක් තනයි. වස්තු දුර වන්නේ,

(1) 8 cm (2) 16 cm (3) 20 cm (4) 24 cm (5) 32 cm

(36) එක් කෙළවරක් වසන ලද නලයක මූලික ස්වරය 512 Hz වේ. මෙම නළයේ දෙකෙළවර විවෘත කළ විට එහි මූලික සංඛ්‍යාතය විය හැක්කේ,

(1) 1536 Hz (2) 1024 Hz (3) 512 Hz (4) 256 Hz (5) 128 Hz

(37) දිග 6 m හා ස්කන්ධය 12 kg වන ඒකාකාර දණ්ඩක එක් කෙළවරක් රූපයේ පරිදි ජල භාජනයක නිදහසේ පෘෂ්ඨයේ සිට 3 m ගැඹුරු ලක්ෂ්‍යයකට නිදහසේ අසව් කර ඇත. දණ්ඩ සාදා ඇති ද්‍රව්‍යයේ සාපේක්ෂ ඝනත්වය 0.5 වේ. දණ්ඩේ දිගින් 5 m දිගක් ජලය තුළ ගිලී සමතුලිතව පැවතීම සඳහා අනෙක් කෙළවරට සම්බන්ධ කළ යුතු වස්තුවේ බර (W) වන්නේ,




(1) 70 N (2) $\frac{17}{3}$ N (3) $\frac{7}{5}$ N

(4) $\frac{7}{2}$ N (5) $\frac{70}{3}$ N

(38) මුහුදු ජලයේ අයිස් කුට්ටියක් පාවේ. අයිස්වල ඝනත්වය 920 kgm^{-3} වේ. මුහුදු ජලයේ ඝනත්වය 1030 $kg\ m^{-3}$ වේ. පාවෙන අයිස් කුට්ටියේ නොගිලුන පරිමාව, මුළු පරිමාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වෙනුයේ,

(1) 8% (2) 11% (3) 34% (4) 89% (5) 95%

(39) රූපයේ දක්වා ඇත්තේ යම් සත්ත්වයෙකු විසින් තම ආරක්ෂාව සඳහා සාදාගත් භූගත තුඹසකි. A හා B හි ස්ථානීය පිහිටුම් අනුව A මතින් 2 ms^{-1} ප්‍රවේගයෙන් ගලායන වාත ධාරාවක් B මතින් 8 ms^{-1} ක ප්‍රවේගයෙන් ගලායයි. A පිහිටුමට සාපේක්ෂව 4 m ඉහළින් B පිහිටා ඇති අතර ගලායන වාතයේ ඝනත්වය 1.2 kgm^{-3} වේ. තුඹස තුළ සිටින සත්ත්වයා ග්‍රහණය කරනු ලබන පීඩන වෙනස වන්නේ,




(1) 8.04 Pa (2) 84 Pa (3) 48 Pa (4) 36 Pa (5) 4.8 Pa

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(40) රූපයේ පරිදි ස්කන්ධය M හා අරය r වන වෘත්තාකාර තැටියක් කේන්ද්‍රය හරහා යන ලම්බක අක්ෂයක් මඟින් විච්ඡේදනය කර ඇත. ස්කන්ධය m වන කුඩා තැටි සතුන් තැටියේ පරිධිය ඔස්සේ V වේගයෙන් ඇවිද යයි. ඌට ආරම්භක ලක්ෂයට පැමිණීමට ගත වන කාලය වන්නේ, $(I = \frac{1}{2} MV^2)$




(1) $\frac{2\pi rM}{mV}$ (2) $\frac{\pi rM}{mV}$ (3) $\frac{2\pi r}{V\left(\frac{2m}{M}+1\right)}$

(4) $\frac{2\pi r^2}{V\left(\frac{2m}{M}+1\right)}$ (5) $\frac{2\pi r}{V(M+m)}$

(41) ස්කන්ධය M හා අවස්ථිති සූර්ණය 1 වූ ජව රෝදයක් ආරම්භයේ දී තත්පරයට භ්‍රමණ n සිදු කරයි. ජව රෝදය නිශ්චලතාවයට පත්වීමේදී ඝර්ෂණයට එරෙහිව කෙරුණු කාර්යය ප්‍රමාණය වන්නේ,

(1) $\frac{1}{2} Mn^2$ (2) $\frac{In^2}{2}$ (3) $\frac{1}{2} \pi^2 In^2$ (4) $\frac{2}{M} \pi^2 In^2$ (5) $2\pi^2 In^2$

(42) අරය R වන ඒකාකාර තැටියක් රූපයේ පරිදි එහි අක්ෂය වටා ∞ කෝණික ගම්‍යතාවකින් භ්‍රමණය වේ. එය සුමට තිරස් තලයක් මත සිරුවට තබනු ලැබේ. V_A, V_B, V_c යනු A, B, C ලක්ෂ්‍යය වල රේඛීය ප්‍රවේග නම්,



(1) $V_A \neq V_B \neq V_C$


(2) $V_A = V_B = V_C$

(3) $V_A = V_C > V_B$

(4) $V_A < V_B < V_C$

(5) $V_A > V_B > V_C$

(43) ස්කන්ධය M හා අරය R වන තැටියක් කේන්ද්‍රය හරහා යන තිරස් අක්ෂයක් වටා සිරස් තලයක භ්‍රමණය වීමට හැකි වන සේ සුමටව විවර්තනය කර ඇත. තැටිය වටා ඔතා ඇති සැහැල්ලු නූලක කෙළවරක් ස්කන්ධය m වන P වස්තුවක් එල්ලා චලනය වීමට සැලැස්සූ විට තැටියේ අරය (R) අනුව P වස්තුවේ ත්වරණය (a) විචලනය වන අයුරු දැක්වෙන ප්‍රස්ථාරය කුමක් වේ ද? තැටිය O වඩා අවස්ථිති සූර්ණය $\frac{1}{2}MR^2$ වේ.





(44) සාපේක්ෂ ඝනත්වය 1.6 හා 4.8 වන ලෝහ දෙකක් මිශ්‍ර කිරීමෙන් සාදා ගත හැකි මිශ්‍ර ලෝහයේ පරිමා අතර අනුපාතය 3.5 වන්නේ නම් මිශ්‍ර ලෝහයේ සාපේක්ෂ ඝනත්වය වන්නේ,

(1) 2.4 (2) 3.2 (3) 3.6 (4) 4.0 (5) 4.6

(45) හරස්කඩ වර්ගඵලය 6 cm^2 බැගින් වූ සමාන බාහු සහිත U නලයකට බාගයක් පිරෙන තුරු ඝනත්වය 1g cm^{-3} වන ජලය දමා එක් බාහුවකට ඝනත්වය 0.85 cm වූ ද්‍රවයක උසකට දමා ඇත. පොදු ද්‍රව මට්ටමේ සිට 14 cm ක් උසින් ජලය පමණක් ඇති බාහුවේ සිදුරක් ඇති වූයේ නම් ඉවතට යන ජල පරිමාව වනුයේ,

(1) 2 ml (2) 4 ml (3) 6 ml (4) 14 ml (5) 24 ml

SLGURU.LK
For Educational Purpose Only


SLGURU.LK

(46) A හා B පාරදෘශ්‍ය මාධ්‍ය දෙකක අවධි කෝණ අතර වෙනස θ වේ. A මාධ්‍යයේ වර්තන අංකය n_A නම් B මාධ්‍ය වර්තන අංකය වනුයේ,

(1) $\dfrac{1}{\text{Sin}^{-}\left[\text{Sin}^{-1}\left(\frac{1}{n_{A-\theta}}\right)\right]}$ (2) $\dfrac{1}{\text{Sin}^{-1}\left(\text{Sin}^{-1}\left(\frac{1}{n_{B-\theta}}\right)\right)}$ (3) $\dfrac{1}{\text{Sin}^{-1}\left(\frac{1}{n_{A-\theta}}\right.}$

(4) $\dfrac{1}{\text{Sin}^{-1}\left(\frac{1}{n_{B-\theta}}\right)}$ (5) $\dfrac{1}{\text{Sin}^{-1}\left(\text{Sin}^{-1}\left(\frac{1}{n_{A-\theta}}\right)\right)}$


(47) දුනු නියතය k වන සැහැල්ලු හෙලික්සිය දුන්නක් රළු තිරස් තලයක් මත ඇති ස්කන්ධයන් m_1 හා m_2 වන $(m_1 < m_2)$ ලී කුට්ටි දෙකක් මඟින් තෙරපා තබා ඇත. පෘෂ්ඨ ස්ථිතික ඝර්ෂණ සංගුණකය μ නම් දුන්නේ උපරිම සම්පීඩනය විය යුත්තේ,




(1) $\dfrac{\mu m_1 g}{K}$ (2) $\dfrac{\mu m_2 g}{K}$ (3) $\dfrac{\mu(m_1 + m_2)g}{2K}$

(4) $\dfrac{\mu g m_1}{2K}$ (5) $\dfrac{\mu g}{K}\left(\dfrac{1}{m_1} + \dfrac{1}{m_2}\right)$


(48) සිලින්ඩරයක් වටා සැහැල්ලු තන්තුවක් වට කීපයක් ඔතා එහි නිදහස් කෙළවරින් රඳවාගෙන එහි අක්ෂය තිරස් වන පරිදි මුදා හරිනු ලැබේ. අවසානයේ දී එය තන්තුවෙන් ගිලිහේ. මුළු චලිතය සඳහා එහි කෝණික විස්ථාපනය කාලය t සමඟ විචලනය පහත පරිදි වේ.



(49) දුම්රිය මැදිරියක් තුළ ඇති ජල බඳුනේ ලී කුට්ටියක් පාවෙමින් පවතී. දැන් දුම්රිය a ත්වරණයෙන් දක්වා ඇති දිශාවය චලිත වේ නම් වාත ප්‍රතිරෝධය නොගිනු කළ ජලය තුල කුට්ටියේ පිහිටීම විය හැක්කේ,



(50) ජලය ස්වල්පයක් සහිතව ප්ලාස්ටික් බෝතලය තුළ ඇති ජලයේ පරීක්ෂණ නලයක් යටිකුරු ලෙස යාන්තමින් පාවෙමින් පවතී. බෝතලය හොඳින් වසා ඇත. බඳුන දෙපසින් තෙරපා ගෙන ඇති විට,



(A) නලය තුළ ජල මට්ටම ඉහළ නගින අතර එය නියත ත්වරණයෙන් පහළට ගමන් කරයි.

(B) නලය තුල උඩුකුරු තෙරපුම ක්‍රමයෙන් අඩු වේ.

(C) ඉහත සංසිද්ධිය පැහැදිලි කිරීමට ආකිමිඩිස් නියමය, හා නිව්ටන් නියමය, බොයිල් නියමය, පැස්කල් මූල ධර්මය යන සියල්ල අවශ්‍ය වේ.

මින් සත්‍ය වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා C පමණි. (4) B හා C පමණි. (5) A, B හා C සියල්ලම.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

“Education is not preparation for life; education is life itself.” — John Dewey



Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය . 12 ශ්‍රේණිය . 2026

Third Term Test - Grade 12 - 2026

01 S II

භෞතික විද්‍යාව . II

පැය තුනයි
Three Hours

අමතර කියවීම් කාලය - මි. 10 යි
Additional Reading Time - 10 minutes

නම / විභාග අංකය : .....

A කොටස - ව්‍යුහගත රචනා


- දී ඇති ඉඩ අවකාශ භාවිත කර සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

B කොටස - රචනා

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- **9 (A)** හා **9 (B)** යන ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගත හැකිය.
- **10 (A)** හා **10 (B)** යන ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් පමණක් තෝරාගත හැකිය.
- (ගුරුත්ව ත්වරණය $g = 10\ ms^{-2}$)

---

(01) සර්වසම හෙලීක්සිය දුනු දෙකක් සහ m ස්කන්ධය සහිත කුට්ටියක් භාවිතයෙන් ගුරුත්වජ ත්වරණය (g) සෙවීම සඳහා ශිෂ්‍යයෙකු විසින් සකස් කරන ලද පරීක්ෂණාත්මක සැකසුමක් රූපයේ දැක්වේ. මෙහි දී දුනු දෙක සමාන්තරගතව සම්බන්ධ කර කුට්ටිය එල්ලා ඇත.



(a) මෙම පරීක්ෂණය ආරම්භ කිරීමට පෙර, දුන්නක ස්වභාවික දිග මැනීමට ඔබ භාවිතා කරන මිනුම් උපකරණය කුමක් ද?

.....

(b) දුනු දෙකෙහි ඉහළ කෙළවරවල් ස්ථාවර ආධාරකයකට සවිකර ඇති අතර, පහළ කෙළවර m ස්කන්ධයට සම්බන්ධ කර ඇත. පද්ධතිය සමතුලිත අවස්ථාවේ පවතින විට දුන්නක දිග L වේ. දුන්නක ස්වභාවික දිග L_0 නම් සහ දුන්නක දුනු නියතය K නම්, පද්ධතියේ සමතුලිතාව සඳහා සමීකරණයක් ලියන්න.

.....

.....

.....

.....

.....

.....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(c) දැන් ස්කන්ධය සිරස්ව මඳක් පහළට ඇද නිදහස් කරනු ලැබේ. එවිට පද්ධතිය සරල අනුවර්තී චලිතයක (S.H.M.) යෙදේ යැයි උපකල්පනය කරන්න.

(i) මෙම දෝලනවල කාලාවර්තනය (T) සඳහා ප්‍රකාශනයක් m සහ K ඇසුරෙන් ලියන්න.

.....

.....

(ii) එක් දුන්නක ස්කන්ධය m_s නම්, දෝලනය වන පද්ධතියේ ඵලදායී ස්කන්ධය $M_{eff} = m + \frac{2}{3}m_s$ මඟින් ලබා දෙන බව උපකල්පනය කරන්න. මෙම අවස්ථාවේදී පද්ධතියේ කාලාවර්තනය (T) සඳහා නව ප්‍රකාශනයක් ලියන්න.

.....

.....

.....

.....

.....

(d) ශිෂ්‍යයා විසින් විවිධ ස්කන්ධ (m) භාවිතා කරමින් අනුරූප කලාවර්ත (T) මනිනු ලබයි.

(i) කාලාවර්තය මැනීමේ දී දෝෂ අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ප්‍රායෝගික පියවරක් සඳහන් කරන්න.

.....

.....

(ii) m (x - අක්ෂය) ට එදිරිව T^2 (y - අක්ෂය) ප්‍රස්ථාරයක් ඇඳීමෙන් දුන්නේ දුනු නියතය (K) සෙවීමට ශිෂ්‍යයා තීරණය කරයි. මෙම ප්‍රස්ථාරයේ අනුක්‍රමණය (M) සඳහා ප්‍රකාශනයක් ලබාගන්න.

.....

.....

.....

(e) දුන්නේ දුනු නියතය K පහත සමීකරණය මඟින් ලබාදේ.

$$K = \frac{\pi r^4 n}{8R^3}$$

n - පොටවල් ගණන
R - දුන්නේ අරය

(i) කම්බියේ අරය (r) ඉතා නිවැරදිව මැනීමට භාවිතා කළ හැකි උපකරණය නම් කරන්න.

.....

(ii) R මැනීමේ දී දුන්නේ පිටත විෂ්කම්භය (d_1) සහ ඇතුළත විෂ්කම්භය (d_2) මැනීම වඩාත් සුදුසු ය. d_1 සහ d_2 සඳහා ප්‍රකාශනයක් සහ ඇසුරෙන් ලබා ගන්න.

.....

.....

.....

.....


.....

.....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(02) ඒකාකාර හරස්කඩ වර්ගඵලය A වූ u නලයක් තුළ ඝනත්වය s වූ ද්‍රවයක් පවතී. නිශ්චලතාවයේ පවතින විට ද්‍රව කඳේ මුළු දිග 2 L වේ.



(a) පද්ධතිය සමතුලිතතාවයේ පවතින විට, ද්‍රව කඳෙහි ස්කන්ධය (M) සඳහා ප්‍රකාශනයක් L, A සහ P ඇසුරෙන් ලියන්න.

.....

(b) දැන් ද්‍රව කඳේ එක් කෙළවරක් මත සුළු අතිරේක පීඩනයක් යොදා එය සමතුලිත පිහිටුමේ සිට x සිරස් දුරකින් පහළට තෙරපා නිදහස් කරනු ලැබේ. ද්‍රව්‍ය දුස්ස්‍රාවී නොවන බවත්, නලයේ බිත්ති සමඟ ඝර්ෂණයක් නොමැති බවත් උපකල්පනය කරන්න.

.....

(i) මෙම අවස්ථාවේ දී ද්‍රව මට්ටම් දෙක අතර පවතින උස වෙනස x ඇසුරෙන් කොපමණ ද?

.....

.....

(ii) මෙම උස වෙනස නිසා ද්‍රව කඳ මත ඇති වන සඵල බලය (F) සඳහා ප්‍රකාශනයක් x, A, s සහ g ඇසුරින් ලියන්න.

.....

.....

.....

(c) නිදහස් කළ පසු ද්‍රව කඳේ චලිතය සඳහා නිව්ටන්ගේ දෙවන නියමය යොදන්න. එමඟින් ද්‍රව කඳේ ත්වරණය (a), $a = -\left(\frac{g}{L}\right)x$ මඟින් ලබාදෙන බව පෙන්වන්න.

.....

.....

.....

(d) (i) ද්‍රව කඳේ චලිතය සරල අනුවර්තී චලිතයක් වන බව ඉහත (c) හි ප්‍රතිඵලය ඇසුරින් පැහැදිලි කරන්න.

.....

.....

.....

(ii) මෙම දෝලනයේ කාලාවර්තය (T) සඳහා ප්‍රකාශනයක් L සහ g ඇසුරින් ලබාගන්න.

.....

.....

.....

.....

(e) විවිධ ද්‍රව දිග (2L) භාවිතා කරමින් කාලාවර්තය (T) මැන බැලීමට ශිෂ්‍යයෙකු පරීක්ෂණයක් සැලසුම් කරයි. ඔහු විසින් g හි අගය සෙවීම සඳහා L^2 ට එදිරිව T^2 ප්‍රස්ථාරයේ අඳිනු ලබයි.

(i) මෙම ප්‍රස්ථාරයේ අනුක්‍රමණය (M) සඳහා ප්‍රකාශනයක් ලියන්න.

.....

.....

.....

(ii) පරීක්ෂණයේ දී ලබාගත් ප්‍රස්ථාරයේ අනුක්‍රමණය $4.01\ S^2m^{-1}$ විය. සඳහා අගයත් ගණනය කරන්න. ($\pi^2 = 9.87$ ලෙස ගන්න)

.....

.....

.....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(03) අනුනාද නලයක් සහ විවිධ සංඛ්‍යාත සහිත සරසුල් කට්ටලයක් භාවිතයෙන් වාතයේ ධ්වනි ප්‍රවේගය (V) සෙවීමට ශිෂ්‍යයෙකු සැලසුමක් පිළියෙල කරයි.

(a) මෙහිදී භාවිතා කරන සරසුලක් කම්පනය කර නලයේ විවෘත කෙළවරට ඉහළින් තැබිය යුතුය.

(i) සරසුල කම්පනය කිරීම සඳහා භාවිතා කරන උපාංගය කුමක් ද?

.....

.....

(ii) උපරිම අනුනාදයක් ලබා ගැනීම සඳහා සරසුලේ බාහු දෙක නලයේ මධ්‍ය අක්ෂයට සාපේක්ෂව තැබිය යුත්තේ කෙසේදැයි රූප සටහනක ඇඳ දක්වන්න.

(b) නලය ජලයේ සම්පූර්ණයෙන්ම ගිල්වා සෙමින් ඉහළට ගන්නා විට පළමු අනුනාද අවස්ථාවට අදාළ වායු කඳේ දිග (l_1) මැන ගනු ලැබේ.

(i) අනුනාදය සිදුවන අවස්ථාව ශ්‍රවණය මඟින් හඳුනා ගන්නේ කෙසේ ද?

.....

.....

(ii) වායු කඳේ දිග l_1 ධ්වනියේ තරංග ආයාමය λ සහ ආන්ත ශෝධනය (e) අතර සම්බන්ධතාවය ලියන්න.

.....

.....

(c) ශිෂ්‍යයා එම සරසුලම භාවිතා කරමින් දෙවන අනුනාද අවස්ථාව සඳහා වන අනුනාද දිග (l_2) ද මැන ගනී.

(i) l_2 සඳහා ප්‍රකාශනයේ λ හා e ඇසුරෙන් ලබාගන්න.

.....

.....

(ii) ආන්ත ශෝධනය (e) ඉවත් කර ධ්වනි ප්‍රවේගය V සඳහා ප්‍රකාශනයක් සංඛ්‍යාතය f, l_1 සහ l_2 ඇසුරෙන් ලබාගන්න.

.....

.....

(d) ශිෂ්‍යයා විසින් විවිධ සරසුල් සඳහා ($l_2 - l_1$) අගයන් ලබාගෙන ($^1/_f$) (x - අක්ෂය) ට එදිරිව (($l_2 - l_1$) (y - අක්ෂය) ප්‍රස්ථාරයක් අඳිනු ලැබේ.

(i) මෙම ප්‍රස්ථාරය මුල ලක්ෂ්‍ය හරහා යන සරල රේඛාවක් විය යුතු බව පෙන්වන්න.

.....

.....

(ii) ප්‍රස්ථාරයේ අනුක්‍රමණය M නම්, වාතයේ ධ්වනි ප්‍රවේගය (V) සඳහා ප්‍රකාශනයක් M ඇසුරෙන් ලියන්න.

.....

.....

.....

.....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(e) එක් සරසුලක් භාවිතා කර l_1 සහ l_2 මැනීමෙන් ලබාගන්නා ප්‍රවේගයට වඩා ප්‍රස්ථාරික ක්‍රමය මඟින් ලබාගන්නා ප්‍රවේගය වඩාත් විශ්වාසදායක වීමට හේතුව පැහැදිලි කරන්න.

.....

.....

.....

.....

(f) අනුනාද තලයේ විෂ්කම්භය D නම්, ආන්ත ශෝධනය e සහ D අතර සම්බන්ධය $e = 0.3D$ ලෙස දන්නා අවස්ථාවක l_1 ට එදිරිව $1/f$ අතර ප්‍රස්ථාරයේ අන්තඃඛණ්ඩය ඇසුරින් තලයේ විෂ්කම්භය සොයා ගන්නේ කෙසේදැයි දක්වන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....

(04) සිහින් උත්තල කාචයක නාභිය දුර (f) සෙවීම සඳහා ශිෂ්‍යයෙකු විසින් විද්‍යාගාරයේ දී පරීක්ෂණයක් සැලසුම් කරයි. මේ සඳහා ඔහුට උත්තල කාචයක්, කාච රඳවනයක්, ආලෝකමත් කරන ලද වස්තුවක්, තිරයක් සහ මීටර් රූලක් ලබා දී ඇත.

(a) පරීක්ෂණය ආරම්භ කිරීමට පෙර කාචයේ දළ නාභිය දුර සොයා ගැනීම වැදගත් වේ.

(i) කාචයක දළ නාභිය දුර සොයා ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

.....

.....

.....

(ii) පරීක්ෂණය සිදු කිරීමේ දී දළ නාභිය දුර දැන සිටීම වැදගත් වන්නේ ඇයි?

.....

.....

.....

(b) ශිෂ්‍යයා වස්තුව සහ තිරය අතර කාචය තබා තිරය මත පැහැදිලි ප්‍රතිබිම්බයක් ලබාගනී.

(i) මෙහිදී තිරය මත ලැබෙන ප්‍රතිබිම්බයේ ස්වභාවය කුමක් ද?

.....

.....

(ii) වස්තුවේ සිට කාචයට ඇති දුර u ද, කාචයේ සිට තිරයට ඇති දුර V ද ලෙස මනිනු ලැබේ. u සහ V මැනීමේ දී සිදුවිය හැකි දෝෂයක් අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

.....

.....

.....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(c) කාච සූත්‍රය $\frac{1}{V} - \frac{1}{u} = \frac{1}{f}$ ලෙස දී ඇතැයි සලකන්න.

(i) $\frac{1}{u}$ ට එදිරිව $\frac{1}{V}$ ප්‍රස්ථාරයක් ඇන්දේ නම් ලැබෙන ප්‍රස්ථාරයේ ස්වභාවය කුමක් ද?

.....

.....

.....

(ii) එම ප්‍රස්ථාරය මඟින් කාචයේ නාභිය දුර (f) සොයා ගන්නා ආකාරය දක්වන්න.

.....

.....

.....

(d) ශිෂ්‍යයා u හි විවිධ අගයන් සඳහා V මැන ප්‍රස්ථාරයක් අඳිනු ලැබේ.

(i) $u = V$ වන අවස්ථාවේ දී u සහ V සම්බන්ධතාවය f ඇසුරෙන් ලියන්න.

.....

.....

.....

(ii) වස්තුව සහ තිරය අතර තිබිය යුතු අවම දුර f ඇසුරින් කොපමණ ද?

.....

.....

.....

(e) මෙම පරීක්ෂණයේ දී තිරය වෙනුවට දෘශ්‍ය කුරක් භාවිතා කරන්නේ නම්, ප්‍රතිබිම්බය පවතින ස්ථානය නිවැරදිව හඳුනා ගැනීමට භාවිතා කරන ක්‍රමය නම් කරන්න.

.....

.....

.....

(f) කාචය සහ වස්තුව අතර දුර, එහි නාභිය දුරට වඩා අඩු වුවහොත් තිරය මත ප්‍රතිබිම්බයක් ලබා ගත හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

.....

.....

.....

.....

.....

.....

.....

.....

.....


.....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

B කොටස - රචනා

(05) (a) ඉන්දියන් සාගරයේ උණුසුම් ජල ප්‍රදේශයක ඇති වූ ''දිට්ටා'' සුළි කුණාටුව (ditta storm) පසුගිය දිනවල විශාල විනාශයක් සිදු කරමින් ශ්‍රී ලංකාව හරහා ගමන් කරන ලදී. මුහුදු ජලයේ උෂ්ණත්වය 28^0C ට වඩා වැඩි වීම හේතුවෙන් විශාල වශයෙන් වාෂ්පීභවනය සිදු වේ. උණුසුම් හා තෙත වායු ස්කන්ධ ඉහළට නැගීම නිසා මුහුදු මට්ටම ආසන්නයේ පීඩන අවපාතයක් ඇතිවේ. එම අවපාතය කරා වටාපිටාවේ වායු වේගයෙන් ගලා එන අතර පෘථිවියේ භ්‍රමණය හේතුවෙන් එම වායු ස්කන්ධ සර්පිලාකාරව භ්‍රමණය වෙයි. කුණාටුවේ මධ්‍යය ඇස ලෙස හඳුන්වන අතර එය වටා ඉතා ප්‍රබල සුළං කලාපයක් නිර්මාණය වෙයි.



කුණාටුවේ ඇසට $r = 25$ km දුරින් පිහිටි වායු ස්කන්ධයක් 180 km h^{-1} නියත වේගයකින් වෘත්තාකාර පථයක ගමන් කරයි. එම ස්ථානයේ වායු ඝනත්වය 1.2 km g^{-3} වේ. කුණාටුවේ ඇස ආසන්නයේ වායු පීඩනය 1.00×10^5 Pa වේ.

(i) සුළි කුණාටු ඇතිවීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන වායුගෝලීය සාධක දෙකක් සඳහන් කරන්න.

(ii) වායු ස්කන්ධයේ වේගය SI ඒකක වලට පරිවර්තනය කරන්න.

(iii) වායු ස්කන්ධයෙන් කේන්ද්‍රාභිසාරී ත්වරණය (a_r) ගණනය කරන්න.

(iv) වායු ස්කන්ධය $m = 1.5 \times 10^7$ kg නම් එම වායු ස්කන්ධය මත ඇති වන කේන්ද්‍රාභිසාරී බලය (F_r) ගණනය කරන්න. එම කේන්ද්‍රාභිසාරී බලය හටගන්නේ කෙසේදැයි සඳහන් කරන්න.


(b) අධික වර්ෂාව හේතුවෙන් 2.5×10^3 kg ස්කන්ධයක පස් කුට්ටියක් 30^0 ක බෑවුමක් ඔස්සේ පහළට ලිස්සා යයි. පස් හා භූමිය අතර ගතික ඝර්ෂණ සංගුණකය 0.30 වේ. ($\sqrt{3} = 1.7$ ලෙස ගන්න.)

(i) බෑවුමට සමාන්තරව පස් කුට්ටියෙහි බරෙහි සංරචකය ගණනය කරන්න.

(ii) භූමිය හා පස් කුට්ටිය අතර ඇතිවිය හැකි උපරිම ඝර්ෂණ බලය ගණනය කරන්න.

(iii) පස් කුට්ටියේ ත්වරණය (a) නිර්ණය කරන්න.


(iv) පස් කුට්ටිය භූමිය මත ලිස්සා යාමට පෙර ස්කන්ධය M හා අරය R වූ විශාල ගෝලාකාර ගලක් කඳු බෑවුමේ h උසක සිට පහළට පෙරළෙයි. කඳු පාමුල්දී ගලෙහි ප්‍රවේගය $V = \sqrt{\frac{10\,gh}{7}}$ මඟින් ලබා දෙන බව පෙන්වන්න. (ගෝලාකාර ගලෙහි ආවස්ථිති ඝූර්ණය $I = \frac{2}{5} MR^2$ (1 රූපය බලන්න.)



1 රූපය

(v) $h = 140$ m, $g = 10$ ms^{-2} නම් V එහි අගය ගණනය කරන්න. ($\sqrt{5} = 2.2$ ලෙස ගන්න.)

(c) අධික ගංවතුර තත්වයන් වලදී රථවාහන මාවත් හරහා විශාල ප්‍රවේග වලින් (V), ජල පහරවල් ගමන් කරයි (2 රූපය). මෙවැනි අවස්ථාවක මාර්ගය හරහා මෝටර් රථයක් පැදවීමට එතරම් සුදුසු නොවන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.




2 රූපය

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(06) මිසයිල විනාශ කිරීම සඳහා ඊශ්‍රායලය වැනි රටවල් විසින් ප්‍රබල ලේසර් කිරණ උපයෝගී කරගනිමින් නවීන ආරක්ෂණ පද්ධති සංවර්ධනය කර ඇත. ලේසර් ක්‍රියාව පදනම් වී ඇත්තේ අණුක ශක්ති මට්ටම් අතර ඉලෙක්ට්‍රෝන ගමන් කිරීම මතය. අණුවක් ශක්තිය අවශෝෂණය කරන විට ඉලෙක්ට්‍රෝනයක් ඉහළ ශක්ති මට්ටමකට ගමන් කරන අතර ස්වයංසිද්ධ විමෝචනය හෝ උත්තේජිත විමෝචනය මඟින් එය පහළ ශක්ති මට්ටමකට පැමිණේ. උත්තේජිත විමෝචනයේ දී ශක්තිය $E = hf$ $(h = 6.6 \times 10^{-34}\ Js)$ වන ෆෝටෝනයක් තවත් සමාන ෆෝටෝනයක් විමෝචනය කරයි. එමඟින් සුසංයෝගී, ඒක වර්ණ සහ ඉහළ දිශානුගත ආලෝක කදම්භයක් නිපදවයි (1 රූපය). අඛණ්ඩ ලේසර් ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සඳහාද, බාහිර ශක්ති ප්‍රභවයක් භාවිතයෙන් ගහන අපවර්තනයක් නිර්මාණය කරනු ලබන අතර, දර්පණ දෙකක් සහිත දෘශ්‍ය අනුනාදයක් ක්‍රියාකාරී මාධ්‍යය හරහා ෆෝටෝන නැවත නැවත පරාවර්තනය කිරීමෙන් ආලෝකය වර්ධනය කිරීමට උපකාරී වේ. මෙම ගුණාංග නිසා, ලේසර් එකකට ඉතා කුඩා ප්‍රදේශයකට ඉතා විශාල ශක්ති ප්‍රමාණයක් සාන්ද්‍රණය කළ හැක.



(1 රූපය)

ආරක්ෂක තත්වයකදී, ලේසර් පද්ධතියක් 600 nm තරංග ආයාමයකින් 400 kW ක් පමණ අඛණ්ඩ ක්ෂමතා බලයක් ඉලක්කයටම නිකුත් කරයි. ලේසර් කදම්භය 2 km ක් දුරින් පිහිටි මිසයිලයක් මතට නාභි ගත කර ඇති අතර, එය 2 cm ක අරයක් සහිත කුඩා ලේසර් රවුමක් සාදයි. (මෙවැනි ලේසර් රවුම් විශාල ප්‍රමාණයක් ලේසර් ආරක්ෂණ පද්ධතිය මඟින් ඉලක්කය වෙත යොමු කරයි.) මිසයිලය ඇලුමිනියම් වලින් සාදා ඇති අතර එහි ස්කන්ධය 4 kg ක් පමණ වන අතර විශිෂ්ට තාප ධාරිතාව $900\ Jkg^{-1}K^{-1}$ වේ. ප්‍රමාණවත් කාලයක් සඳහා ප්‍රමාණවත් ලෙස ලේසර් ශක්තිය ලබා දෙන්නේ නම් ලේසර් කදම්භයේ දැඩි ශක්ති සාන්ද්‍රණය හේතුවෙන් මිසයිලයේ මතුපිට වේගයෙන් රත් වී, දිය වී, එහි ව්‍යුහය විනාශ වේ. මේ සඳහා 700 K ක පමණ උෂ්ණත්වය ඉහළ යාමක් අවශ්‍ය වේ.

කෙසේ වෙනත්, නවීනව නිපදවා ඇති $1000\ ms^{-1}$ වේගයෙන් ගමන් කරන සුපර්සොනික් මිසයිල මෙම ලේසර් බිම් ආරක්ෂණ පද්ධතියට තර්ජනයකි. එවැනි සුපර් සොනික් (supersonic) මිසයිලයක් 2 km ක දුරකින් අනාවරණය කර ගත හැකි අතර ඉලක්කය දෙසට ඉතා ඉක්මණින් ගමන් කරයි. එමගින් ලේසර් කදම්බය තුළ එලදායී රැඳී සිටීමේ කාලය සැලකිය යුතු ලෙස අඩු කරයි. ලේසර් පද්ධතිය තත්පර කිහිපයකින් විනාශ කිරීමට අවශ්‍ය ශක්තිය ලබා දීමට තරම් බලවත් වුවද, මිසයිලයෙන් ඉතා වේගවත් චලිතය නිසා එය විනාශ කිරීමට අවශ්‍ය කාලය වඩා ඉතා අඩු කාලයකදී ලේසර් අන්තර් ක්‍රියා කලාපය පසු කරයි. නමුත් ඕනෑම මිසයිලයක් විනාශ කිරීම සඳහා ප්‍රමාණවත් ශක්තියක් ලබා දීම සඳහා ලේසර් පද්ධතියට තත්පර 5 ක පමණ අඛණ්ඩ නිරාවරණයක් අවශ්‍ය වුවද, අධිවේගී (Supersonic) මිසයිල යන්නේ අදහස එය ඉතා කෙටි කාලයක් තුළ එලදායී අන්තර් ලේසර් ක්‍රියා කලාපය පසු කරන බවයි. (2 රූපය)

(a) (i) ලේසර් ක්‍රියාවලියේ දී අවශෝෂණය යන්න පැහැදිලි කර ඒ සඳහා අවශ්‍ය ශක්තිය ලබාගන්නේ කෙසේ ද?

(ii) ස්වයංසිද්ධ විමෝචනය හා උත්තේජිත විමෝචනය අතර වෙනස පහදන්න.

(b) (i) ගහන අපවර්තනයක් යනු කුමක් ද? සහ ලේසර් ක්‍රියාවලියේ දී එය වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ii) ප්‍රකාශ අනුනාදකයක කාර්යය භාරය ලියා දක්වන්න.

(c) ලේසර් කිරණවල ගුණ දෙකක් සඳහන් කර එක් එක් ගුණය මිසයිල විනාශ කිරීමට දායක වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

SLGURU.LK
For Educational Purpose Only


SLGURU.LK

(d) (i) ආරක්ෂක පද්ධතියක භාවිතා වන ලේසර් කිරණවල සංඛ්‍යාතය ගණනය කරන්න.

(ii) ආරක්ෂක පද්ධතියේ භාවිතා වන ලේසර් ෆෝටෝනයක ශක්තිය ගණනය කරන්න.

(iii) කුඩා වෘත්තාකාර ලේසර් ලපයේ වර්ගඵලය ගණනය කරන්න. (radius 2.0 cm, $\pi = 3$)

(iv) ලේසර් කදම්බයේ තීව්‍රතාව ගණනය කරන්න.



(2 රූපය)

ලේසර් ආරක්ෂණ පද්ධතිය -
මිසයිලයේ චලිතයන්ට සංවේදීව ගමන් ගන්නා මිසයිලය ඉලක්ක කරමින් ආනතිය වෙනස් කරයි. පද්ධතියට මිසයිල හඳුනාගත හැක්කේ 2 km සීමාවේ ය.

(e) (i) තත්පර පහක කාලයකදී මිසයිල ආරක්ෂණ පද්ධතිය නිපදවන ලේසර් ශක්තිය කොපමණ ද?

(ii) සුපර්සොනික් මිසයිලයක් සම්පූර්ණයෙන් විනාශ කිරීමට අවශ්‍ය ශක්තිය ගණනය කරන්න. (සුපර්සොනික් මිසයිලයක ස්කන්ධය, විශිෂ්ට තාප ධාරිතාව හා ව්‍යුහය සාමාන්‍ය මිසයිලයකට සර්වසම යැයි සලකන්න.)

(iii) සුපර්සොනික් මිසයිලයක් විනාශ කිරීමට ලේසර් පද්ධතියට ලැබෙන කාලය ගණනය කරන්න.

(iv) සුපර්සොනික් මිසයිලයක් සම්පූර්ණයෙන් විනාශ කිරීමට අවශ්‍ය අමතර ශක්තිය ගණනය කරන්න. එම අමතර ශක්තිය ලබා ගැනීමට සුදුසු ක්‍රමයක් යෝජනා කරන්න. (400 kW මුළු ක්ෂමතාවට ශක්ති හානියකින් තොරව ඉලක්කයට ලැබේ යැයි සළකන්න.

ලේසර් ශක්තිය ඉහත d (iii) සඳහන් වෘත්තාකාර ලප 100 ඉලක්කය වෙත එල්ල කරයි.)

(07) (a) රික්තයක් තුළදී ආලෝකයේ වේගය C වන අතර වීදුරු තුළදී ආලෝකයේ වේගය ν වේ.

(i) වීදුරුවල වර්තනාංකය n_g සඳහා ප්‍රකාශනයක් C සහ ν ඇසුරින් ලියා දක්වන්න.

(ii) $C = 3 \times 10^8 \text{ ms}^{-1}$ සහ $\nu = 2 \times 10^8 \text{ ms}^{-1}$ වීදුරුවල වර්තනාංකය n_g ගණනය කරන්න.


(iii) වර්තනාංකය අඩු මාධ්‍යක සිට වර්තනාංකය වැඩි මාධ්‍යකට ආලෝකය ගමන් ගන්නා විට පහත සඳහන් එක් එක් රාශීන්ගේ අගය අඩුවේද? වැඩිවේද? වෙනස් නොවේද? යන්න සඳහන් කරන්න.

(1) වේගය (ν)

(2) සංඛ්‍යාතය (f)

(3) තරංග ආයාමය (λ)

(b) ඉහත (a) (ii) සඳහන් වීදුරුවලින් සාදන ලද සමපාද ප්‍රිස්මයක් සලකන්න. (1 රූපය)



1 රූපය

(i) ප්‍රිස්මයක අපගමන කෝණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ii) ප්‍රිස්ම කෝණය A සඳහා ප්‍රකාශනයක් r_1 හා r_2 ඇසුරින් ලියන්න.

(iii) d සඳහා ප්‍රකාශනයක් i_1, r_1, i_2, r_2 ඇසුරින් ලියා දක්වන්න.

(iv) i_1 පතන කෝණය සමඟ d විචලනය වන ආකාරය දළ ප්‍රස්ථාරයක දක්වා අවම අපගමන අවස්ථාවේ පතන කෝණය i_m ලෙසත්, අවම අපගමන කෝණය D_m ලෙසත් ලකුණු කරන්න.

(c) අවම අපගමන අවස්ථාවේදී ඉහත (a) (ii) වීදුරු වලින් සාදන ලද සමපාද ප්‍රිස්මය හරහා ගමන් ගන්නා ආලෝක කිරණයක් ප්‍රිස්මය දෙපස සමමිතික වේ. එනම් $i_1 = i_2$ ද $r = r_1 = r_2$ වේ.

(i) $i_1 = i_2 = i$ ලෙස සලකමින් i සඳහා ප්‍රකාශනයක් A, D_m ඇසුරින් ලියන්න.

(ii) r සඳහා ප්‍රකාශනයක් A ඇසුරින් ලියන්න.

(iii) ඉහත (c) (i), (ii) ප්‍රකාශන උපයෝගී කර ගනිමින් n_g සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න.

(iv) අවම අපගමන කෝණය D_m ගණනය කරන්න. ($\sin^{-1} 0.75 = 48.6^0$ බව සලකන්න.)

(d) (i) ප්‍රිස්මයක් තුළින් ගමන් ගන්නා සුදු ආලෝකය අපකිරණය (වර්ණවලට වෙන්වීම) සිදුවන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ii) ප්‍රිස්මයක් තුළින් ගමන් ගන්නා ආලෝක කිරණයක් 90^0 කින් 180^0 කින් හරවා ගත හැක්කේ කෙසේදැයි සුදුසු කිරණ සටහන් මඟින් පැහැදිලි කරන්න.

(e) ආලෝක ප්‍රිස්මවල එක් භාවිතයක් ලියා දක්වන්න.

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(08) (a) (i) නුගැසුම් හෙවත් ස්පන්ද යනු මොනවා ද?

(ii) නුගැසුම් ඇතිවීම සඳහා තිබිය යුතු අවශ්‍යතා සඳහන් කරන්න.

(iii) ප්‍රගමන තරංගයක සහ ස්ථාවර තරංගයක ඇති වෙනස තන්තුව දිගේ සම්ප්‍රේෂණය වූ ශක්තිය ඇසුරින් සඳහන් කරන්න.


(b) (i) ඇදී තන්තුවක හටගන්නා තීර්යක් තරංග ප්‍රවේගය සඳහා ප්‍රකාශනයක් තන්තුවේ ආතතිය T සහ රේඛීය ඝනත්වය m ඇසුරින් ලියා දක්වන්න.

(ii) දිග l වූ ඇදී තන්තුවක මූලික සංඛ්‍යාතය f_0 සඳහා ප්‍රකාශනයක් l, T සහ m ඇසුරින් ලබාගන්න. මෙවැනි ඇදී තන්තුවක සියලුම ප්‍රසංවාද ලබාගත හැකි බව පෙන්වන්න.


(iii) අනුනාද දිග l_n නම් n වන උපරිනාතයේ සංඛ්‍යාතය f_n සඳහා ප්‍රකාශනයක් l_n, T හා m ඇසුරින් ලියා දක්වන්න.

(iv) 50 cm දිග කම්පනය වන ඇදී ඒකාකාර කම්බියක් අසල සංඛ්‍යාතය f වන සරසුලක් නාද කළ විට තත්පරයකදී ස්පන්ද 4 ක් ලැබුණි. තන්තුවේ ආතතිය නොවෙනස්ව තබා එහි දිග 49 cm දක්වා අඩුකර එම සරසුලම නැවතත් නාද කළ විට තත්පරයකදී ඇසෙන ස්පන්ද සංඛ්‍යාව 3 ක් විය. සරසුලෙහි පැවතිය හැකි සංඛ්‍යාතයන් මොනවා ද?

(c) ධ්වනිමානය උපයෝගී කර ගනිමින් ලෝහයක ඝනත්වය සෙවීමට ශිෂ්‍යයකු සැලසුම් කරයි. ඒ සඳහා ඔහු ලබාගත් පාඨාංක පහත දක්වා ඇත. (1 රූප බලන්න.) (m = කම්බියේ රේඛීය ඝනත්වය)



T = තන්තුවේ ආතතිය
M = ලෝහ කුට්ටියේ ස්කන්ධය
u = ලෝහ කුට්ටිය ගිල්වූ පසු හටගන්නා උඩුකුරු තෙරපුම



(1 රූපය)

ලෝහ කුට්ටිය ද්‍රවයේ ගිල්වීමට පෙර පළමුවරට සැහැල්ලු කඩදාසි ආරෝහනය ක්ෂණිකව ඉවතට විසිවන අවස්ථාවේ ලී සේතු අතර පරතරය l_1 ද ලෝහ කුට්ටිය ද්‍රවයේ සම්පූර්ණයෙන්ම ගිල්ලූ අවස්ථාවට අනුරූප සේතු අතර පරතරය ද l_2 වේ. (සෑම පරීක්ෂණාත්මක පියවරක් සඳහාම ලී සේතු අතර පරතරය අවමයකින් ආරම්භ කරන ලදී. එකම සරසුල භාවිතා කරන ලදී.)

(i) f සඳහා ප්‍රකාශනයක් l_1, M, g සහ m ඇසුරින් ලියන්න.

(ii) f සඳහා ප්‍රකාශනයක් l_2, M, g, m සහ u ඇසුරින් ලියන්න.

(iii) ඉහත (c) (i) හා (ii) යොදා ගනිමින් ලෝහය සාදා ඇති ද්‍රව්‍යයේ සාපේක්ෂ ඝනත්වය d සඳහා ප්‍රකාශනයක් ලබාගන්න.

(iv) $l_1 = 40\ \text{cm}$ සහ $l_2 = 37.4\ \text{cm}$ නම් ලෝහය සාදා ඇති ද්‍රව්‍යයේ ඝනත්වය කොපමණ ද?

$(\rho_w = 1000\ \text{kgm}^{-3})$


SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(09) (A) චන්ද්‍රයා වටා ගොස් පෘථිවියට නැවත පැමිණෙන අභ්‍යවකාශ යානයක් වායුගෝලයට ඇතුළු වන විට, වායු සම්පීඩනය සහ ඝර්ෂණය හේතුවෙන් එහි මතුපිට උෂ්ණත්වය $T_1 = 6000\ ^0C$ ක් දක්වා ඉහළ යයි. යානය ආරක්ෂා කිරීම සඳහා ඇබ්ලේෂන් (Ablation) තාක්ෂණය යොදා සාදන ලද තාප ආවරණයකින් (heat shield) ආවරණය කර ඇත. පිටත පෘෂ්ඨය ඉතා අධික උෂ්ණත්වයකට ලක් වන විට, පිටත ආරක්ෂක තට්ටුව සෙමින් පිලිස්සෙමින්, දියවෙමින් හෝ වාෂ්ප වෙමින් තාපය අවශෝෂණය කරගනී. පිලිස්සීමෙන් පසු තාප සන්නායකතාව අඩු කළු කාබන් තට්ටුවක් සෑදේ. එමඟින් තාපය ඇතුළතට යාම අඩු වී රොකට් ඇතුළත ව්‍යුහය ආරක්ෂා වේ. එලෙස සෑදෙන පිටත 1 ස්තරයේ ඝනකම $K_1 = 0.05\ Wm^{-1}K^{-1}$ යැයිද සලකන්න. ඇතුළත 2 ස්තරයේ ඝනකම $L_2 = 2.0$ cm ද එහි තාප සන්නායකතාව $K_2\ 0.20\ Wm^{-1}K^{-1}$ වේ. යානයේ ඇතුළත උෂ්ණත්වය $T_2 = 20\ ^0C$ ලෙස තබාගත යුතුය. ස්ථර දෙක මධ්‍යයේ උෂ්ණත්වය T වේ.



1 රූපය



2 රූපය

(a) (i) තාප සන්නායකතාව යනු කුමක් ද?

(ii) තාප සංක්‍රමණය වන ක්‍රම මොනවා ද?

(b) (i) මාධ්‍යයක් හරහා තාපය සන්නයනය වීමේ සීඝ්‍රතාව සඳහා වන සමීකරණය ලියා සියලු සංකේත හඳුන්වා දෙන්න.

(ii) මෙම සමීකරණය භාවිතයේ දී සිදුකරනු ලබන මූලික උපකල්පන දෙකක් සඳහන් කරන්න.

(c) (i) අභ්‍යවකාශ යානාවක් පෘථිවි වායුගෝලයට නැවත පැමිණෙන විට යානය මතුපිට උෂ්ණත්වය ඉහළ යාමට හේතු මොනවා ද?

(ii) පිටත 1 ස්ථරයේ සිට ඇතුළත 2 ස්තරය දක්වා තාප සන්නයන සීඝ්‍රතාව,

$$\frac{Q}{t} = \frac{A(T_1 - T_2)}{\frac{L_1}{K_1} + \frac{L_2}{K_2}}$$ යන සමීකරණය මගින් ලබාදෙන බව පෙන්වන්න.

